# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/05/MF/2/7 | ........................................ | 2021.06.07 |

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ :- 2021/12**

සියළුම සමෘද්ධි විධායක කමිටු / පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති / සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්.

**<u>කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතු කොට ගෙන ශාරීරික අනතුරු රක්ෂණ අරමුදල් වැඩසටහන පුළුල් කිරීම - කොවිඩ් -19 රෝගය වැළදී මියයාම වෙනුවෙන් සහ රාජකාරි අවස්ථාවේ සිදුවන හදිසි අනතුරු වෙනුවෙන් රක්ෂණ ආවරණය ලබාදීම</u>**

**01. හැඳින්වීම.**

I. දි/ප්‍ර/බැ2015/02 අංක සහිතව 2015.08.14 දින නිකුත් කර ඇති "දිවිනැගුම ප්‍රජාමූල බැංකු/ ප්‍රජාමූල බැංකු සමිති සඳහා අතරැදි මුදල් රක්ෂණ වැඩසටහන හා දිවිනැගුම ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩලය සඳහා ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම" නම් චක්‍රලේඛය අනුව මෙතෙක් ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක වූයේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු කාර්ය මණ්ඩලය සඳහා පමණි. ඒ මගින් රක්ෂණ ආවරණය ලබාදෙන ලද්දේ ප්‍රජාමූල බැංකු සතු මුදල් සොරා ගැනීමක් පැහැර ගැනීමක් සිදුවන අවස්ථාවක නිලධාරින්ට සිදුවන ශාරීරික අනතුරු වෙනුවෙන් පමණි.

II. උද්ගත වී ඇති කොවිඩ් - 19 වසංගත තත්ත්වය යටතේ වුවද ප්‍රජාමූල බැංකු, බැංකු සමිති කාර්ය මණ්ඩලයට හා ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන්ට විශාල කාර්ය භාරයක් ඉටු කිරීමට සිදුවේ. එම රාජකාරි කටයුතුවලදි මහජනයා හා ඍජුව ගැටෙමින් කටයුතු කිරීමට සිදු වී ඇත. මෙසේ කටයුතු කිරීම හේතුවෙන් මේ වනවිට නිලධාරීන් විශාල ප්‍රමාණයක් කොවිඩ් - 19 වසංගත රෝගයට ගොදුරු වී ඇත. ඒ අතරින් කීප දෙනෙකු මිය ගිය බව ද වාර්තා වී තිබේ. ජීවිත අවධානමක් සහිතව රාජකාරි කරන මෙම නිලධාරීන්ට රක්ෂණ ආවරණයක් ලබාදීම අත්‍යාවශ්‍ය වුවකි. එබැවින් මෙතෙක් ක්‍රියාත්මක වූ ශාරීරික අනතුරු රක්ෂණ වැඩසටහන තවදුරටත් පුළුල් කෙරේ.

III. කොවිඩ් 19 රෝගය හේතුවෙන් මිය යන සමෘද්ධි ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල බැංකු සමිති නිලධාරින්ට, ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන්ට, හා රු. 5000/- සමාජ ප්‍රතිලාභ දීමනාව බෙදීමේ රාජකාරිවලට


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

සම්බන්ධ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ට මෙම රක්ෂණ ආවරණය ලබාදේ.

IV. රාජකාරි අවස්ථාවේ සිදුවන හදිසි අනතුරු සඳහා ද සමෘද්ධි ප්‍රජාමූල බැංකු, ප්‍රජාමූල බැංකු සමිති හා ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන්ට හදිසි අනතුරු රක්ෂණ ආවරණයක් ලබාදේ.

**02. කොවිඩ් රෝගය වෙනුවෙන් රක්ෂණ ආවරණ ලබාදීම.**

I. කොවිඩ් රෝගය හේතුවෙන් ඉහත I – III හි සඳහන් නිලධාරියෙකු මිය ගියහොත් එම නිලධාරියාගේ යැපෙන්නන්ට රුපියල් ලක්ෂ 10 ක රක්ෂණ වන්දි මුදලක් ගෙවනු ලැබේ.

**03. හදිසි අනතුරු රක්ෂණ ආවරණය ලබාදීම.**

I. රාජකාරියේ නියැලෙමින් සිටිය දී සිදුවන හදිසි අනතුරු වෙනුවෙන් ප්‍රජාමූල බැංකු, බැංකු සමිති හා ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරීන්ට රෝහල් ගත වීමක දී (රජයේ හෝ පෞද්ගලික) දිනකට රු. 1000/- බැගින් උපරිම දින 15 කාලයක් සඳහා රක්ෂණ වන්දි මුදලක් ගෙවනු ලැබේ.

II. රාජකාරියේ නියැලෙමින් සිටිය දී සිදු වන හදිසි අනතුරකින් ඉහත 3.1 සඳහන් නිලධාරියෙකු මියගිය හොත් මියගිය නිලධාරියාගේ යැපෙන්නන්ට රුපියල් ලක්ෂ 10 ක වන්දි මුදලක් ගෙවනු ලැබේ.

**04. රක්ෂණ වාරික මුදල් එවීම.**

I. මෙම රක්ෂණය වෙනුවෙන් සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති රක්ෂණ ආවරණය ලබාගත යුතුය.

II. සෑම ප්‍රජාමූල බැංකුවක්ම 2021 වසරේ සිට නැවත දැනුම් දෙනතුරු මේ සඳහා වසරකට රු. 40,000/- ක රක්ෂණ වාරික මුදලක් එවිය යුතුය.

III. සෑම ප්‍රජාමූල බැංකු සමිතියක්ම වසරකට රු. 25,000/- රක්ෂණ වාරික මුදලක් එවිය යුතුය

IV. වාරික මුදල් එවීමෙන් පසු පමණක් අදාල නිලධාරීන්ට මෙම රක්ෂණය ආවරණය හිමිවේ.

**05. චෙක්පත් එවීම.**

I. 2021 වසර සඳහා වන රක්ෂණ වාරික මුදල් 2021 ජුලි මස 15 දිනට පෙර එවිය යුතුය. දි/ප්‍ර/බැ 2015/2 චක්‍රලේඛයේ 6.1 ජේදයේ දක්වා ඇති ආකාරයට මෙම චෙක්පත ලිවිය යුතුය.

II. චෙක්පත දින 90 ක කාලයක් සඳහා වලංගු වන පරිදි සකස් කළ යුතුය. චෙක්පතේ වටිනාකම, දිනය, ගිණුම් අංකය නිවැරදිව සටහන් කර නියමිත අත්සන් යොදා නිල මුද්‍රාව තැබිය යුතුය.

III. පවතින සංචරන සීමා හේතුවෙන් තැපැල් ප්‍රමාදයක් සිදුවිය හැකි බැවින් මෙම වසරට අදාල චෙක්පත් එවීමට පහත පරිදි කටයුතු කළ යුතුය.

a. බැංකු කළමනාකරු නියමිත පරිදි චෙක්පත සකස් කර ආවරණ ලිපියක් සමඟ **(රක්ෂණ අංකය මෙහි අනිවාර්යයෙන් සඳහන් කළ යුතුය.)** ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු වෙත භාරදිය යුතුය. භාරදුන් බවට හා භාරගත් බවට අත්සන් ලබාගත යුතුය.

b. ප්‍රජාමූල බැංකු සමිති කළමනාකරු තම බල ප්‍රදේශයට අයත් සියලුම බැංකුවලින් අදාල චෙක්පත් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. චෙක්පත් භාර ගැනීමේදී ඒවායේ නිරවද්‍යතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

c. ප්‍රජා මූල බැංකු සමිති කළමනාකරු, ප්‍රජාමූල බැංකු සමිතියට අදාල චෙක්පත ද සකස් කර අදාල බැංකුවල චෙක්පත් සමඟ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට භාරදීමට කටයුතු කළ යුතුය. ආවරණ ලිපියක් සහිතව චෙක්පත් භාරදිය යුතුය. එසේම භාරගත් බවට හා භාරදුන් බවට අත්සන් ලබාගත යුතුය. ආවරණ ලිපියේ බැංකුවල නම රක්ෂණ අංකය, චෙක්පත් අංකය, වටිනාකම සඳහන් කළ යුතුය.

d. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් මෙම කාර්යය දිස්ත්‍රික් බැංකු විෂය කළමනාකරුට පැවරිය යුතුය. එම කළමනාකරු තම දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිතිවලට අදාල රක්ෂණ වාරික චෙක්පත් ගෙන්වා ගත යුතුය. චෙක්පත් භාරගැනීමේදී නිවැරදිතාවය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. අඩුපාඩු සහිත චෙක්පත් භාර නොගත යුතුය.

e. දිස්ත්‍රික්කයේ විෂය භාර කළමනාකරු දිස්ත්‍රික්කයට අදාල චෙක්පත් සියල්ල ගෙන්වා ගැනීමෙන් පසු සමෘද්ධි බැංකුවේ, බැංකු සමිතියේ නම, රක්ෂණ අංකය, චෙක්පත් අංකය චෙක්පතේ වටිනාකම සහිත ලේඛනයක් (ඇමුණුම් 01 පරිදි) පිළියෙල කර එම ලේඛනය හා චෙක්පත් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂුද්‍ර මූල්‍ය අංශයට අතේ ගෙනවිත් භාරදිය යුතුය. අඩුපාඩු සහිත චෙක්පත් රැගෙන ඒමෙන් වැලකිය යුතුය.

f. ප්‍රධාන කාර්යාලයට චෙක්පත් රැගෙන ඒමට පෙර 0718012254 දුරකථනය අංකයට ඇමතුමක් ලබා දී දිනයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.

g. ප්‍රධාන කාර්යාලය මගින් චෙක්පත බැංකු ගත කර ගිණුමට මුදල් එකතු වූ පසු, ඒ පිළිබඳ දිස්ත්‍රික්කයේ මෙම විෂයභාර කළමනාකරුට දුරකථනයෙන් දැනුම් දෙනු ඇත. එම කළමනාකරු අදාල බැංකු දැනුවත් කළ යුතුය. අනතුරුව ලිඛිත තහවුරුවක් ලබාදෙනු ඇත.

**06. ගිණුම් සටහන් තැබීම.**

I. සමෘද්ධි ප්‍රජාමූල බැංකු දි/ප්‍ර/බැ/2015/02 චක්‍රලේඛයේ ජේද අංක 8 හි දක්වා ඇති උපදෙස් පරිදි ගිණුම් සටහන් තැබිය යුතුය.

II. ප්‍රජාමූල බැංකු සමිති සඳහා කේත අංක 6404 යටතේ පොදු ලෙජරයේ නව ගිණුමක් හඳුන්වා දේ. බැංකු සමිති පහත පරිදි ගිණුම් සටහන් තැබිය යුතුය.

| | | |
|---|---|---|
| වැය ගිණුම - | ප්‍රජාමූල බැංකු සමිති කාර්ය මණ්ඩලය සඳහා | |
| | ශාරීරික අනතුරු රක්ෂණ ගාස්තු එවීම (කේත අංක 6404) | - හර |
| | ජංගම ගිණුම - පොදු (කේත අංකය 7002) | - බැර |

**07. වන්දි ඉල්ලුම් කිරීම.**

I. හදිසි අනතුරක් හේතුවෙන් රෝහල් ගත වුවහොත් එහිදි වෛද්‍ය වාර්තා සමඟ ඇමුණුම - 2 අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය. හදිසි අනතුර වන අවස්ථාවේ රාජකාරි කටයුතුවල නියැලි සිටි බවට අදාල නිලධාරියා විසින් තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය. එම තහවුරු ලිපිය ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කළ යුතුය.

II. යම් නිලධාරියෙකු කෝවිඩ් රෝගය හේතුවෙන් මිය ගියහොත් යැපෙන්නන් වෙනුවෙන් සමීපතම අධීක්ෂණ නිලධාරියා වන්දි ඉල්ලීමේ අයදුම් පත්‍රය - ඇමුණුම 2 සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතුය. මරණ සහතිකය, වන්දි ප්‍රතිලාභ, ඉල්ලීමේ ලිපිය, ඥාතීත්වය තහවුරු කිරීමට අදාල අනිකුත් සහතික ඒ සමඟ ඉදිරිපත් කළ යුතුය.

III. හදිසි අනතුරකින් මිය ගිය විට ද ඉහත සඳහන් අන්දමට ඉල්ලුම් කළ යුතුය. එයට අමතරව රාජකාරියේ නියැලුන බවට සනාථ කළ හැකි ලියවිලි සහ පොලිස් වාර්තා ද ඉදිරිපත් කළ යුතුය.

**08. වන්දි මුදල් ගෙවීම.**

I. අදාල වාර්තා පදනම් කර ගනිමින් අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් වන්දි මුදල් ගෙවනු ලැබේ.

II. මරණයක දී එම නිලධාරියා විවාහක නම් කලත්‍රයාට හා දරුවන්ටත්, අවිවාහක නම් මාපියන්ටත්, වන්දි මුදල් ගෙවනු ලැබේ.

III. මියගිය නිලධාරියාගේ ඥාතීන් වෙත වන්දි මුදල් චෙක්පතක් මගින් ලියාපදිංචි තැපෑලෙන් යොමු කෙරේ.

IV. හදිසි අනතුරක් සිදු වූ අවස්ථාවක පූර්ණ අකර්මන්‍යතාවයකට ලක්වුවහොත් සම්පූර්ණ වන්දි මුදල වන රුපියල් ලක්ෂ 10 ම ගෙවනු ලැබේ. දෑතම අහිමිවීම, දෙපයම අහිමිවීම, එක් අතක් සමඟ එක් කකුලක් අහිමිවීම. එක් ඇසක් සමඟ එක් අතක් හෝ කකුලක් අහිමිවීම, දෑසම අහිමිවීම, රාජකාරි කල නොහැකි අයුරින් යම් මානසික ව්‍යාකූලතාවයකට පත්වීම පූර්ණ අකර්මනන්‍යතාවය ලෙස සැලකේ. මෙම කරුණු වෛද්‍ය වාර්තා මගින් තහවුරු කළ යුතුය.

V. අර්ධ අකර්මන්‍යතාවයකට ලක්වුවහොත් රුපියල් ලක්ෂ 5 වන්දි මුදලක් ගෙවනු ලැබේ. එක් අතක් අහිමිවීම, එක් කකුලක් අහිමිවීම එක් ඇසක් අහිමිවීම අර්ධ අකර්මන්‍යතාවයක් ලෙස සලකනු ලැබේ. වෛද්‍ය වාර්තා මගින් මෙම කරුණු සනාථ කළ යුතුය.

VI. මෙයට අමතරව වෙනත් අබාධිත තත්ත්වයකට පත් වුවහොත් වෛද්‍ය වාර්තා සමඟ අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් වන්දි ගෙවනු ලැබේ.

VII. කොවිඩ්- 19 රෝගය වැළඳි රෝහල් ගත වූ නිලධාරින්ට රෝහල් ගතවීම වෙනුවෙන් වන්දි මුදල් ගෙවනු නොලැබේ.

මේ හැරුනු විට අතුරුදි මුදල් හා ශාරිරික අනතුරු රක්ෂණය වෙනුවෙන් නිකුත් කර ඇති දි/ප්‍ර/බැ 2015/02 චක්‍රලේඛයේ සඳහන් අනිකුත් කරුණු නොවෙනස්ව පවතී.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. සියලුම ප්‍රාදේශීය ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
6. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.
7. සියලුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ස.

ඇමුණුම - 02

# කොවිඩ් -19 රෝගය වැළදී මියයාම වෙනුවෙන් / රාජකාරි කාලය තුළ සිදු වූ හදිසි අනතුරක් වෙනුවෙන් රක්ෂණ ආවරණය ඉල්ලුම් කිරීම

01. හදිසි අනතුරු හේතුවෙන් රෝහල් ගත වූ/ කොවිඩ්/ හදිසි අනතුරු වෙනුවෙන් මිය ගිය නිලධාරියාගේ සම්පූර්ණ නම:-..........................................................................

02. රාජකාරි ස්ථානය සමෘද්ධි බැංකුව/ බැංකු සමිතිය/ ක්ෂේත්‍රය :-..........................................................................

03. හදිසි අනතුරක් නම් එම අවස්ථාවේ සිදු කල රාජකාරි කටයුතුවල ස්වාභාවය :-..........................................................................

04. රක්ෂණ වාරික මුදල් එවූ ආසන්න වර්ෂය, දිනය හා චෙක්පත් අංකය :-..........................................................................

05. නිත්‍යානුකුල ඥාතීන් පිළිබඳ විස්තර (මරණයක දී පමණි.)

| | **නම** | **මිය ගිය පුද්ගලයාට ඇති ඥාතීත්වය** |
|---|---|---|
| 1. | ................................................................... | ...................................... |
| 2. | ................................................................... | ...................................... |
| 3. | .................................................................. | ...................................... |
| 4.. | ................................................................... | ....................................... |

(මරණ සහතිකය, වෛද්‍ය වාර්තා, ඥාතීත්වය සනාථ කිරීමට අදාල විවාහ, උප්පැන්න සහතික අමුණා එවිය යුතුය.)

ඉහත තොරතුරු සත්‍ය බවත් රාජකාරියේ නියැලි සිටිය දී හදිසි අනතුරක් සිදු වී ඇති බවත් ඒ හේතුවෙන් රෝහල්ගතව සිටි බවත් කාරුණිකව දන්වා සිටිමි.

......................................

අයදුම්කරුගේ අත්සන (නිලධාරියා රෝහල්ගතව සිටි අවස්ථවක)

---

ඉහත නම් සඳහන් නිලධාරියා ........................................... රාජකාරියේ නියැලි සිටි බවත්, කෝවිඩ් - 19 හේතුවෙන්/ හදිසි අනතුරක් හේතුවෙන් මිය ගොස් ඇති බවත් කාරුණිකව දන්වා සිටිමි.

...............................................

සම්පතම අධීක්ෂණ නිලධාරියා

බැංකු කළමනාකරු/ ප්‍රජාමුල බැංකු සමිති කළමනාකරු/

මුලස්ථාන කළමනාකරු (නිලධාරියාගේ මරණයක දී)

---

ඉහත තොරතුරු නිවැරදි බවත් වන්දි මුදල් ගෙවීම සුදුසු බවත් නිර්දේශ කර ඉදිරිපත් කරමි.

...................................

ප්‍රාදේශිය ලේකම්

---

ඉහත නිර්දේශ අනුමත කර අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

......................................

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

**(අනවශ්‍ය වචන කපා හරින්න.)**

ඇමුණුම - 01

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
ක්ෂුද්‍ර මූල්‍ය අංශය
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**<u>කොවිඩ් - 19 හා හදිසි අනතුරු රක්ෂණය වෙනුවෙන් අදාල චෙක්පත් භාරදීම</u>**

.................................. දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රජාමූල බැංකු .................. ක් ප්‍රජාමූල සමිති................. ක් ලද චෙක්පත් ........... ක් මේ සමඟ යොමු කරමි.

| **සමෘද්ධි බැංකුවේ/ ප්‍රජාමූල බැංකු සමිතියේ නම** | **රක්ෂණ අංකය** | **චෙක්පත් අංකය** | **වටිනාකම රු.** |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

මෙම චෙක්පත් සියල්ල පරීක්ෂා කළ බවත් අඩුපාඩු සහිත චෙක්පත් නොමැති බවත් සඳහන් කරමි.

කළමනාකරු
දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය

අවශ්‍ය කටයුතු සඳහා ඉහත චෙක්පත් ............. ක් මේ සමඟ යොමු කරමි.

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ